(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 178.]**

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2026 සැප්තැම්බර් 09 බදාදා පූ.භා. 9.30 ට**

---

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

2114/2026

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අලුතින් පිහිටුවන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල හිඟයක් පවතින බවත්;

(ii) එම කාර්යාලවල ගොඩනැගිලි පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ජනතාව දැඩි අපහසුතාවයට පත්ව ඇති බවත්;

(iii) එක් ග්‍රාම සේවා වසමකින් දහසකට අධික ජනගහනයක් සේවා ලබාගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, එම ගැටලු නිරාකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2122/2026

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බැංකු කටයුතුවලදී දෘශ්‍යාබාධිත පුද්ගලයන්ගේ මූල්‍ය රහස්‍යභාවය සුරක්ෂිත කිරීම සඳහා හඬ මාර්ගෝපදේශ සහිත ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සහ බ්‍රේල් යතුරු පුවරු ස්ථාපනය කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව උපදෙස් ලබාදී ඇති බව දන්නේද;

(ii) බැංකුවල ජංගම යෙදවුම් සහ වෙබ් අඩවි ජාත්‍යන්තර වෙබ් අන්තර්ගත ප්‍රවේශ මාර්ගෝපදේශවලට අනුකූල විය යුතු බව පිළිගන්නේද;

(iii) මෙම තාක්ෂණික හා ශ්‍රව්‍ය පහසුකම් සියලු රාජ්‍ය සහ පෞද්ගලික බැංකුවල ස්ථාපිත කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) එම වැඩපිළිවෙළ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා නිශ්චිත කාලරාමුවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය අන්තර්කරණයට නියෝග, බැංකු විසින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව නිසි පරිදි අනුකූලතා විගණන සිදු කරන්නේද;

(ii) පාරිභෝගික ප්‍රඥප්ති උල්ලංඝනය කරන බැංකු සහ රක්ෂණ සමාගම්වලට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) බැංකු පද්ධතිය තුළ අසාධාරණයන්ට ලක්වන ආබාධිත පුද්ගලයන්ට සහන සැලසීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ 'විශේෂිත පාරිභෝගික සහන යාන්ත්‍රණයක්' ස්ථාපිත කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

2126/2026

ගරු දේවානන්ද සුරවීර මහතා,— වෙළඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාතේ, විවිධ සේවා සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) එම සමිති, සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කර තිබේද;

(iii) නොඑසේ නම්, ලියාපදිංචිවී නොමැති සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(iv) පළාත තුළ ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් සහ තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට ඇතුළත් සහ ඇතුළත් නොවූ සමුපකාර බැංකු සංඛ්‍යාව කොපමණද;

(v) 2025.12.31 දිනට පළාත තුළ පවතින සමුපකාර බැංකුවල තැන්පත්කරුවන් සංඛ්‍යාව සහ තැන්පතු ප්‍රමාණය කොපමණද;

(vi) එදිනට තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවීම පැහැර හැර ඇති සමුපකාර බැංකු සංඛ්‍යාව සහ මුදල් ප්‍රමාණය කොපමණද;

(vii) එම බැංකුවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තැන්පතු සහ ණය ආපසු ලබාගැනීම සඳහා කඩිනම් ක්‍රමවේද සකස් කර තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රමවේද කවරේද;

(iii) ලියාපදිංචි නොවූ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමනයට යටත් නොවන සමුපකාර සමිති සහ එම සමිතිවල දූෂණ සහ අක්‍රමිකතා සිදු කළ කළමනාකාරිත්වයට එරෙහිව ගනු ලබන නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2195/2026

ගරු ජේ.සී. අලවතුවල මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා රු. මිලියන 1.5ක ස්ථිර තැන්පතු සඳහා 15%ක පොලී අනුපාතයක් ලබා දුන් බව දන්නේද;

(ii) 2025.02.17 දින ඉදිරිපත් කරන ලද අයවැය යෝජනා මඟින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ රු. මිලියනයක ස්ථිර තැන්පතු සඳහා පවතින පොලී අනුපාතයට අමතරව 3%ක පොලී අනුපාතයක් ලබාදීමට යෝජනා කරන ලද බව පිළිගන්නේද;

(iii) එම අමතර 3%ක පොලී සහනය 2025.12.31 දිනෙන් පසු ආරම්භ කරන ලද ස්ථිර තැන්පතු සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට හිමි නොවන බව දන්නේද;

(iv) 2025.12.31 දිනෙන් පසු ජ්‍යෙෂ්ඨ පුරවැසි වයස සම්පූර්ණ කරන පුද්ගලයන්ට සහ රාජ්‍ය සේවකයන්ට මෙම පොලී අනුපාතය හිමි නොවීම හේතුවෙන් ඔවුන්ට සිදුවන අපහසුතාවය සැලකිල්ලට ගෙන, ඔවුන්ටද අදාළ පොලී සහනය ලබාදීමට කටයුතු කරන්නේද;

(v) මේ වනවිට මෙම පොලී සහනය යටතේ ස්ථාවර තැන්පතු පවත්වාගෙන යන තැන්පතුකරුවන්ගේ තැන්පතු කාලය අවසන් වීමෙන් පසුවද එම පොලී සහනය අඛණ්ඩව ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය,— කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත යටතේ තීරණය,— 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ විධිවිධාන ප්‍රකාරව පත් කරනු ලබන කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික, එකී පනතේ 13 වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන අතර, ඒකාබද්ධ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු හෙයින් ද;

කොමිෂන් සභාව සඳහා පත් කරනු ලබන සාමාජිකයින් අතරින් සභාපතිවරයා ද ඇතුළුව අවම වශයෙන් තිදෙනෙකු (03) පූර්ණ කාලීන සාමාජිකයින් වශයෙන් පත් කිරීමට අදාළ පනතේ 5(5) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සභාපතිවරයා සහ සාමාජිකයින් වෙත පැවරෙන කාර්යභාරයේ වැදගත්කම ද සැලකිල්ලට ගනිමින්, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයින් වෙත පහත පරිදි පාරිශ්‍රමික සහ දීමනා ගෙවීම සඳහා 2026.08.10 දිනැති අංක 26/1522/819/010-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් අනුමැතිය ලබා දී ඇති හෙයින් ද:—

(i) සභාපතිවරයා වෙත මාසිකව රු.135,000.00ක ද, සාමාජිකයින් වෙත මාසිකව රු.90,000.00ක ද පාරිශ්‍රමික ගෙවීමට;

(ii) සභාපතිවරයා සඳහා මාසිකව රු.6,000.00ක ද, සාමාජිකයින් වෙත රු.4,250.00ක ද සන්නිවේදන දීමනාවක් ගෙවීමට; සහ

(iii) මාසික ඉන්ධන හා ප්‍රවාහන දීමනාව පහත පරිදි ගෙවීමට:

| | ඉන්ධන දීමනාව | ප්‍රවාහන දීමනාව* |
|---|---|---|
| සභාපති | 220L | රු.50,000.00 |
| අනෙකුත් සාමාජිකයින් | - | රු.25,000.00 |

* සභාපතිට ප්‍රවාහන දීමනාව හිමි වන්නේ රජය විසින් රියදුරෙකු සහිත නිල වාහනයක් ලබාදිය නොහැකි අවස්ථාවන්හිදී පමණි.

ඊට අනුකූලව, 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනතේ 13 වගන්තිය ප්‍රකාරව, කාන්තාවන් පිළිබඳ ජාතික කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයින්ට ඉහත පරිදි පාරිශ්‍රමික සහ දීමනා රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ගෙවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.

*3.

අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

විසි දෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

දූෂණ විරෝධී (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ගෙවල් කුලී (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2025 සැප්තැම්බර් 24) [1].

*11.

විදුලිසංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2025 අප්‍රේල් 10),— “2025 මාර්තු 14 දින පාර්ලිමේන්තුවේ දී සභාගත කරන ලද බටලන්ද නිවාස යෝජනා ක්‍රමයේ නීති විරෝධී රඳවුම් ස්ථාන හා වධකාගාර පිහිටුවා පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව විසින් සලකා බලනු ලැබිය යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

14.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

15.

ශ්‍රී ලංකා පහසුකම් කළමනාකරණ ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

16.

ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

17.

කෝදාගොඩ ගුණරතන නාහිමි පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

18.

ට්‍රෙඩ්සෝ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

[1]

“පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

1.

2202/2026

ගරු තුරෙයිරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය විශ්වවිද්‍යාලය සහ නැගෙනහිර විශ්වවිද්‍යාලය මඟින් පිරිනමනු ලබන සිද්ධ වෛද්‍ය උපාධිධාරීන්ට අනිවාර්ය සීමාවාසික පුහුණුව ලබා ගැනීම සඳහා අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති දේශීය වෛද්‍ය රෝහල් එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) සීමාවාසික පුහුණු පහසුකම් සහිත එක් එක් රෝහලට 2021 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ඇතුළත් කර ඇති සිද්ධ වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත විශ්වවිද්‍යාලවල සිද්ධ වෛද්‍ය උපාධිධාරීන් සඳහා සීමාවාසික පුහුණු පහසුකම් ලබාදීම සඳහා පහසුකම් නොමැති දිස්ත්‍රික්ක කවරේද;

(iv) එම දිස්ත්‍රික්කවල පිහිටි කිසිදු දේශීය වෛද්‍ය රෝහලක සීමාවාසික පුහුණු පහසුකම් නොමැති වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

2203/2026

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දේශීය වෛද්‍ය උපාධිධාරීන්හට ඔවුන්ගේ අනිවාර්ය සීමාවාසික පුහුණුව සඳහා අමාත්‍යාංශය විසින් අනුමත කර ඇති රෝහල්වල නම් දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම සීමාවාසික පුහුණුව ලබාදීම සඳහා පහසුකම් සහිත එක් එක් රෝහලකට ඇතුළත් කළ හැකි සිද්ධ, ආයුර්වේද සහ යුනානි උපාධි අපේක්ෂකයින්ගේ උපරිම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සීමාවාසික පුහුණුව සඳහා අවශ්‍ය පහසුකම් නොමැති දිස්ත්‍රික්කවල පිහිටි ආයුර්වේද රෝහල් එම පහසුකම්වලින් සමන්විතව සංවර්ධනය කිරීම සඳහා කෙටි කාලීන හෝ දීර්ඝ කාලීන සැලසුම් අමාත්‍යාංශය විසින් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එම සැලසුම්වල විස්තර කවරේද;

(v) එවැනි සැලසුම් මේ දක්වා සකස් කර නොමැති නම්, ඊට හේතු කවරේද;

(vi) මේ දක්වා සීමාවාසික පුහුණුවට අවශ්‍ය පහසුකම් නොමැති දිස්ත්‍රික්කවල අවම වශයෙන් එක් ආයුර්වේද රෝහලක හෝ එම පහසුකම් 2027 වර්ෂය තුළ සලසා දීමට පියවර ගන්නේද;

(vii) නොඑසේ නම්, සෑම දිස්ත්‍රික්කයකම එවැනි පහසුකම් ස්ථාපිත කිරීමට අවශ්‍ය කාලවකවානුව, අපේක්ෂිත මූල්‍ය ප්‍රතිපාදන සහ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය පිළිබඳ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

2204/2026

ගරු තුරෛරාසා රවිකරන් මහතා,— සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආයුර්වේද රෝහල් අතර, අභ්‍යන්තර රෝගී අංශ සහිත සහ අභ්‍යන්තර රෝගී අංශ නොමැති ග්‍රාමීය ආයුර්වේද රෝහල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අභ්‍යන්තර රෝගී අංශ නොමැති ග්‍රාමීය ආයුර්වේද රෝහල් සඳහා මේ දක්වා එම පහසුකම් ලබා නොදීමට හේතු කවරේද;

(iii) රජයේ පිළිගත් ක්‍රමවේද සහ ප්‍රමිතීන්ට අනුව ග්‍රාමීය, දිස්ත්‍රික් සහ මූලික ආයුර්වේද රෝහල්වල තිබිය යුතු ඇඳන් ධාරිතාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) උතුරු සහ නැගෙනහිර පළාත්වල පිහිටි එක් එක් ආයුර්වේද රෝහල් සඳහා වෙන් කර ඇති ඇඳන් සංඛ්‍යාව, රෝහල් අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) රජයේ ප්‍රමිතීන්ට අනුව ග්‍රාමීය, දිස්ත්‍රික් සහ මූලික ආයුර්වේද රෝහල්වල පිළිවෙළින් සේවය කළ යුතු වෛද්‍යවරුන් සහ සිද්ධ විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(vi) උතුරු සහ නැගෙනහිර පළාත්වල පිහිටි ආයුර්වේද රෝහල්වල වර්තමානයේ සේවය කරන ආයුර්වේද වෛද්‍යවරුන් සහ ආයුර්වේද විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව, එක් එක් රෝහල අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vii) එම පළාත්වල මේ දක්වා පළාත් ආයුර්වේද රෝහලක් ස්ථාපිත නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

2257/2026

ගරු අජිත් පී. පෙරේරා මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2025.04.05 දින ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර අධි වෝල්ටීයතා සරල ධාරා සම්ප්‍රේෂණය ඔස්සේ විදුලිය ආනයනය සහ අපනයනය කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබේද;

(ii) එම ගිවිසුමේ පාර්ශ්වකරුවන් කවුරුන්ද;

(iii) ගිවිසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ වනවිට අත්කරගෙන ඇති ප්‍රගතිය කවරේද;

(iv) ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය හෝ රජයට අනුබද්ධ ආයතන විසින් මේ දක්වා දරා ඇති වියදම කොපමණද;

(v) මෙම ගිවිසුම අනුව කටයුතු කිරීම මඟින් ශ්‍රී ලංකාවට ලබාගත හැකි ප්‍රතිලාභ කවරේද;

(vi) ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී පවතින බාධා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?